**හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - අදියර 11 - 2024**

---

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර 11) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 27 දින එළඹි අංක 3483- එස්ආර්අයි සහ 3484- එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.04 සහ 4.03 වගන්තිය සහ ප්‍රංශ නියෝජිත ආයතනය අතර 2018 ඔක්තෝබර් 17 දින එළඹි අංක සීඑල්කේ 1022 01 කේ දරන ණය පහසුකම් ගිවිසුමේ 3.4.4 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ව්‍යාපෘති පහසුකම් පරිපාලන අත්පොතට අනුව, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ලංකා විදුලිබල මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පිවිතුරු බලශක්ති උත්පාදනය, පද්ධති කාර්යක්ෂමතාව සහ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, මධ්‍යම වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ඉල්ලුම් කළමනාකරණය යන සංරචක තුනක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 39,808කට සමාන වූ එ.ජ.ඩො මිලියන 260 ක් වන අතර ඉන් රු. මිලියන 27,985කට සමාන එ.ජ.ඩො මිලියන 180ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව සහ ප්‍රංශ නියෝජිතායතනය එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 11,823 කට සමාන එ.ජ.ඩො මිලියන 80ක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ කටයුතු 2017 ජුලි 10 දින ආරම්භ කරන ලද අතර 2022 ජුනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2024 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබද භෞතික ප්‍රගතිය

මෙම ව්‍යාපෘතිය (අ) සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම (ආ) මධ්‍යම වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ (ඇ) බලශක්ති කාර්යක්ෂමතාව සඳහා ඉල්ලුම කළමනාකරණ වැඩිදියුණු කිරීම යන සංරචක 03 කින් සමන්විත වේ. ඉහත (අ) සහ (ආ) සඳහා පැකේජ 13 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කරන ලදී. ඉහත කරුණුවලට අමතරව, සමාලෝචිත වර්ෂය තුළ ණය මුදලේ ඉතිරියෙන් සම්ප්‍රේෂණ ජාලය සඳහා අමතර කොටස් සහ මෙවලම් ලෙස ද්‍රව්‍ය/උපකරණ මිලදීගෙන ඇත. ඒ පිළිබඳව පහත නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| පැකේජය 2 ලොට් බී 2 යටතේ පාදුක්ක - හොරණ 132 KV, කිලෝමීටර් 25 ක සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2019 පෙබරවාරි 28 වන දින එ.ජ.ඩො 3,835,437 ක පිරිවැයකට ප්‍රදානය කර තිබුණු අතර දින 710ක කාලය දීර්ඝ කිරීමෙන් පසු 2024 මාර්තු 31 වන දින නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, 2024 ජනවාරි 04 වන දින සිවිල් වැඩ සහ ස්ථාපන කටයුතු සියයට 70 කින් ඉවත් කර කොන්ත්‍රාත් මිල එ.ජ.ඩො 2,798,112 ක් ලෙස සංශෝධනය කර තිබුණු අතර ඉතිරි වැඩ ලං.වි.ම විසින් සම්පූර්ණ කළ යුතුවේ. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරුගේ ගබඩාවල පැවති ණය මුදල්වලින් රු. මිලියන 954.98ක් වටිනා විදේශයන්ගෙන් සපයන ලද යන්ත්‍ර සහ අත්‍යාවශ්‍ය අමතර කොටස් ලං.වි.ම වෙත භාර දී නොමැති බවත් විගණිත දිනය වු 2025 ජුනි 02 වන විට ලං.වි.ම විසින් ඉතිරි වැඩ ආරම්භ කර නොමැති බවත් නිරීක්ෂණය විය. එබැවින්, ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම ඉතිරි ඉදිකිරීම් කටයුතු ලං.වි.ම වෙනත් ශාඛාවකට පවරා ඇත. ඒ අනුව, ගබඩා සමීක්ෂණය අවසන් කර ඇති අතර 2025 ජූලි වන විට අමුද්‍රව්‍ය භාර ගැනීමට නියමිත අතර ඉතිරි ව්‍යාපෘති කටයුතු 2026 දෙසැම්බර් වන විට අවසන් කිරීමට නියමිතය. | ව්‍යාපෘතියේ අරමුණ ඉටුකර ගැනීම සඳහා ඉතිරි වැඩ කටයුතු සම්පූර්ණ කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

**2.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| **(අ) පැකේජ 12-ලොට් A** | | |
| පැකේජය 12 ලොට් ඒ යටතේ 220 kv Outdoor Switchgears and Aluminum Tubular Busbars සැපයීම සහ බෙදා හැරීම සඳහා වන කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසියේ 07 හි 18.1 වගන්තියට අනුව, කොන්ත්‍රාත් ප්‍රදානය දැනුම් දීමෙන් දින 28ක් ඇතුළත, ඉහත කොන්ත්‍රාත්තුව විශේෂ කොන්ත්‍රාත් කොන්දේසියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයන් සහ මුදල්වලින් කොන්ත්‍රාත්තුවේ නිසි කාර්යසාධනය සඳහා කාර්යසාධන සුරක්ෂණයක් සැපයුම්කරු විසින් සැපයිය යුතුය වේ. කෙසේවෙතත්, CNY 207,701 ක විදේශීය කොටස සඳහා එවැනි කාර්ය සාධන සුරක්ෂණයක් 2024 පෙබරවාරි 01 වන දින කොන්ත්‍රාත්කරු විසින් දින 65 කට පසුව ලබා දී තිබුණු අතර රු. 435,000ක දේශීය කොටස සඳහා චෙක්පතක් කාර්යසාධන සුරක්ෂණය ලෙස 2023 නොවැම්බර් 27 වන දින කොන්ත්‍රාත් ප්‍රදානය දැනුම් දීමෙන් දින 153 කට පසුව 2024 අප්‍රේල් 29 වන දින කොන්ත්‍රාත්කරු විසින් ලබා දී තිබුණි. | කොන්ත්‍රාත්තුව 2023 නොවැම්බර් 27 වන දින ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත්කරු 2024 පෙබරවාරි 01 වන දින කාර්ය සාධන සුරක්ෂණය ඉදිරිපත් කළ අතර එය අවශ්‍ය කාලය ඉක්මවා තිබුණි. 2024 දෙසැම්බර් 21 වන දින, ශ්‍රී ලංකාවේ අහිතකර ආර්ථික තත්ත්වය හේතුවෙන් බැංකුවලින් සුරක්ෂණ ලබා ගැනීමේදී ඔවුන් මුහුණ දෙන අභියෝග හේතුවෙන් සුරක්ෂණ ඉදිරිපත් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු 2024 ජනවාරි 22 දක්වා දින 28 ක දීර්ඝ කිරීමක් ඉල්ලා සිටින ලදී. | කොන්ත්‍රාත්තුවේ සඳහන් කොන්දේසි දැඩි ලෙස පිළිපැදිය යුතුය. |
| **(ආ) පැකේජ 8 ලොට් බී** | | |
| කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් නොමැතිව පැකේජ 8 ලොට් බී හි රු. මිලියන 225.99 ක ඉතිරි ප්‍රගති ගෙවීම් 2024 සැප්තැම්බර් 05 වන දින රු. මිලියන 163.54ක් සඳහා ලබාගත් කාර්යසාධන සුරක්ෂණ අංක 003BGTEE2402141 සහ 2024 ජුනි 27 සහ 2025 ජනවාරි 10 දින එ.ජ.ඩො 199,500ක් සඳහා ලබාගත් කාර්යසාධන සුරක්ෂණ අංක 003BGTEE2401447 සහ 003BGTEE2500090 මත සෘජු ගෙවීම් සහ විශේෂ විදේශ මුදල් බැංකු ගිණුම හරහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද ඉන්වොයිසි 06 ක් මත කොන්ත්‍රාත්කරුට ගෙවීම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. | ණය කාලය අවසන් කිරීමට පෙර, ව්‍යාපෘතියේ ඉංජිනේරු, සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති), ආසියානු සංවර්ධන බැංකුවේ ණය සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමේ සහ ලං.වි.ම මත අනවශ්‍ය මූල්‍ය බර වළක්වා ගැනීමේ අරමුණින් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද වලංගු බැංකු ඇපකර මත ගෙවීම් සහතික කර නිදහස් කිරීමට අනුමත කර ඇත. | කොන්ත්‍රාත්තුවේ සඳහන් කොන්දේසි දැඩි ලෙස පිළිපැදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ඉහත කොන්ත්‍රාත්තුව සඳහා විගණනයට ඉදිරිපත් කරන ලද කාර්ය සාධන සුරක්ෂණයට අනුව, රු. මිලියන 163.54 කට ලබාගත් සුරක්ෂණය 2025 මාර්තු 31 දක්වා සහ එ.ජ.ඩො 199,500 සඳහා මුලින් ලබාගත් සුරක්ෂණය 2024 සැප්තැම්බර් 30 දක්වා පමණක් වලංගු වූ අතර නැවත එය 2025 ජනවාරි 10 සිට 2025 මාර්තු 31 දක්වා කාල සීමාව ආවරණය කිරීම සඳහා නව සුරක්ෂණයක් ලෙස ලබාගෙන ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, ඉදිකිරීම් කාලය තවමත් අඛණ්ඩව පැවතුනද, එ.ජ.ඩො කොටස සඳහා කාර්ය සාධන සුරක්ෂණය ලබා ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති කළමණාකරණ ඒකකය එ.ජ.ඩො 199,500ක බැංකු සුරක්ෂණය කල් ඉකුත් වීමට පෙර දීර්ඝ කරන ලෙස කොන්ත්‍රාත්කරුගෙන් ඉල්ලා තිබුණි. ඊට ප්‍රතිචාර වශයෙන්, ඔවුන්ගේ ඩොලර් ගිණුමේ ඇති ගැටළු හේතුවෙන් දීර්ඝ කිරීමේ ප්‍රමාදයක් ඇති බව කොන්ත්‍රාත්කරු දැනුම් දෙන ලදී. | මුළු කාලයම ආවරණය වන පරිදි කාර්යසාධන සුරක්ෂණය ලබා ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | **පැකේජ 09** | | |
| | එ.ජ.ඩො 46,349.19 කට සමාන රු. මිලියන 13.86 ක මුදලක් 2024 අගෝස්තු 26 වන දින විශේෂ විදේශ මුදල් බැංකු ගිණුම හරහා සිවිල් වැඩ, ස්ථාපනය සහ අනෙකුත් සේවාවන්හි ඉතිරි කටයුතු සඳහා ඉදිරිපත් කරන ලද 2024 ජුනි 19 දිනැති අංක SC109/INV/EREC/29/LKR දරන ඉන්වොයිසිය වෙනුවෙන් කොන්ත්‍රාත් කොන්දේසිවල නොමැති ව්‍යාපෘතිය අවසානයේ අත්තිකාරම් ගෙවීම් සුරක්ෂණයක් ලෙස ලබාගත් 2024 ජූලි 25 දිනැති අංක 792718 දරන චෙක්පතට එරෙහිව කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | කඩිනමින් වැඩ නිම කිරීමට අනුගමනය කළ යුතු හොඳම විකල්පය ලෙස ලං.වි.ම හි මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගනිමින්, ලං.වි.ම මත අමතර මූල්‍ය බරක් වීම වළක්වා ගනිමින් ආසියානු සංවර්ධන බැංකුවේ ණය සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් මෙය සිදු කරන ලදී. | කොන්ත්‍රාත්තුවේ කොන්දේසි දැඩි ලෙස පිළිපැදීමට පියවර ගත යුතුය. |
| (ඉ) | සිවිල් වැඩ, ස්ථාපනය සහ අනෙකුත් සේවාවන්හි රු. මිලියන 13.86ක ඉහත සඳහන් ඉතිරි වැඩවලින්, පසුව 2025 ජනවාරි 02 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාවට අනුව රුපියල් මිලියන 4.70 ක වටිනාකමක් ඇති වැඩ කොටසක් වැඩ විෂය පථයෙන් අඩු කර තිබුණි. කෙසේවෙතත්, මුළු මුදල දැනටමත් කොන්ත්‍රාත්කරුට අත්තිකාරමක් ලෙස ලබාදී ඇති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ආසියානු සංවර්ධන බැංකුවේ ණය මුදලින් ලැබුණු රු. මිලියන 4.70ක මුදලක් අදාළ ව්‍යාපෘතිය සඳහා යොදා නොගෙන විදුලිබල මණ්ඩලය සතුව පැවතුණි. | ලං.වි.ම සාමාන්‍යාධිකාරීවරයා වෙත නිකුත් කරන ලද රු. මිලියන 13.86ක කොන්ත්‍රාත්කරුගේ චෙක්පත දැනටමත් තැන්පත් කර ඇති බැවින් රු. මිලියන 4.70ක මුදල ලං.වි.ම ගිණුමෙහි පවතී. එවකට පැවති තත්ත්වයන් මත පදනම්ව 2025 ජනවාරි 02 වන දින තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය ගන්නා ලදි. | ව්‍යාපෘති අරමුදල් ඵලදායී ලෙස භාවිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 24.5 වගන්තියට අනුව, ව්‍යාපෘති කළමනාකරු විසින් කොන්ත්‍රාත්කරුට පවතින ඕනෑම දෝෂයක් සහ/හෝ අඩුපාඩු ලිඛිතව දැනුම් දිය යුතු අතර පහසුකම් හෝ එම කොටස නිම වී ඇති බවට සෑහීමකට පත් වී නිමකිරීමේ සහතිකය නිකුත් කළ යුතුය. කෙසේවෙතත්, 2024 ජුනි 10 වන දින කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසියේ 24 වන වගන්තියට අනුව, පැකේජය 09 හි විදුලි වැඩවල දෝෂ 43ක් සහ සිවිල් වැඩවල දෝෂ 270 ක දෝෂ නිවැරදි නොකර නිමකිරීමේ සහතිකය නිකුත් කර ඇත. | නිම කිරීමේ සහතිකය නිකුත් කරන අවස්ථාවේදී, කොන්ත්‍රාත්කරු විසින් පහසුකමේ අපේක්ෂිත ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය සියලුම පරීක්ෂණ සහ ආරම්භ කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇත. (සුභාදනාවි 350MW බලාගාරය සම්බන්ධ කිරීම). එබැවින්, පහසුකම අපේක්ෂිත ක්‍රියාකාරිත්වයට යෙදවිය හැකි වන පරිදි දෝෂ ලැයිස්තුවක් අමුණා නිම කිරීමේ සහතිකය නිකුත් කරන ලදී. | කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුව අඩුපාඩු නිවැරදි කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

## 2.3 අරමුදල් උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘති කාලය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ණය අංක 3483 යටතේ රු. මිලියන 112.02ක් සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශයට අනුව, ව්‍යාපෘතිය වෙනුවෙන් ශ්‍රී ලංකා රජය විසින් රු. මිලියන 72.62කට සමාන යුරෝ 325,984ක බැදීම් ගාස්තුක් දරා ඇත. එබැවින්, භාවිතයට නොගත් අයවැය ප්‍රතිපාදන මත දරන ලද බැදීම් ගාස්තුවලින් කොටසක් ආර්ථික වශයෙන් ලාභදායී නොවන බව නිරීක්ෂණය විය. | විවිධ අනපේක්ෂිත සහ නොවැළැක්විය හැකි තත්වයන් හේතුවෙන් ව්‍යාපෘති දිගු කිරීම් වලංගු සහ සාධාරණ හේතූන් මත පමණි ලබා දී ඇත. ඒ අනුව, මෙම කොන්දේසි යටතේ බැදීම් ගාස්තු ගෙවීම වැළැක්විය නොහැක. | අමතර පිරිවැය අවම කිරීම සඳහා වෙන් කරන ලද අරමුදල් ප්‍රමාදයකින් තොරව භාවිත කිරීමට පියවර ගත යුතුය. |